# සමගිව සිටිමු



දිහන්සා සෙතුනි ඉලන්ගරත්න

# සමගිව සිටිමු

දිහන්සා සෙතුනි ඉලංගරත්න

**ISBN No**

**978-624-208-470-1**

**කතෘගෙ වෙනත් කෘති :**

**බුද්ධිමත් කුරුල්ලො (2023)**

**කෘතිය පළ කරණ දිනය :**

**2024.11.21**

# සමගිව සිටිමු

කතෘ

දිහන්සා සෙතුනි ඉලංගරත්න

සිතුවම්

දිහන්සා සෙතුනී ඉලංගරත්න

කතෘගෙ වෙනත් කෘති : බුද්ධිමත් කුරුල්ලො (2023)

කෘතිය පල කරණ දිනය : 2024.11.21

# පිදුම

පුංචි මල් කැකුළු වන්

අපගේ අනාගතය

යහපත් කරන්නට වෙරදරන

මහමායා විදුහල් මෑණියන්ට

මහත් හද බැතියෙන්

මෙම පොත පුද කරමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී,"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

2024-11-21


ඔන්න එකමත් එක කාලෙක වේයො ගොඩක් හිටියා. වේයො මැටි ගුලි ගෙනල්ලා තුඹසක් හැදුවා. ඒ තුඹස හරිම ලස්සනයි. විශාලයි. වේයෝ හැමෝම සතුටින් කාලය ගත කළා.



එක දවසක් නයෙක් එතනට ආවා. නයා තරහෙන් වේයන්ට මෙහෙම කීවා. ඔය තුඹසෙන් ඔයාලා යන්න.



වේයෝ දුක් වුණා. වේයන්ගෙ නායකයා කීවා තුඹස ඇතුලේ ගොඩාක් ඉඩ තියෙනවා. අපිත් එක්ක ඔයත් ඉන්න. ම්... ම්... ම්... නයා ටිකක් කල්පනා කළා. පසුව ඒකට කැමති වුණා. දැන් නයයි වේයොයි යාලුවොවෙලා සතුටින් හිටියා.



එක දවසක් ළමයෙක් තුඹස ළඟින් ගමනක් යන්න ගියා. ඒ ළමයා ලොකු ලීයකින් තුඹස කඩන්න සූදානම් වුනා. වේයෝ බය වුණා. අඬන්න පටන් ගත්තා.

එක පාරට නයා තුඹසෙන් එළියට ඇවිත් පෙනය පෙන්වූවා. ළමයා බය වී කෑ ගසාගෙන දිව්වා.



වේයෝ නයාට ස්තූති කළා. ඔයා නිසා අපි හැමෝම බේරුණා. ඔයා හිටියෙ නැත්තන් අපි මහන්සි වී හදපු ගෙදර කැඩෙනවා. අපිත් මිය යයි. වේයෝ කීවා. ඒක සුළු දෙයක් මට පුළුවන් ඔයාලව ආරක්ෂා කරන්න. නයා කිව්වා.



පුංචි අපිත් හැමදාම සමගියෙන් ඉමු.

# ස්තූතිය

කතන්දර පොතක් ලියන්න කියා මාව දිරිමත් කළ මාගේ ආදරණීය ගුරු මෑණියන්ටත්,

මම කතන්දරය කියන විට එය ලියූ මාගේ ආදරණීය අම්මාටත්,

කතන්දරය අසා සතුටු වුණු මාගේ ආදරණීය අප්පච්චීටත්, අයියා සහ නංගීටත්,

දහසකුත් වැඩ මැද මාගේ මෙම කතන්දරය ටයිප් කර සකසා දුන් මාගෙ නැන්දට සහ මාමාටත්

මාගෙ හද පිරි ප්‍රණාමය පුද කර සිටිමි.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් .ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර .ණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර .ැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත ්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

ISBN No
978-624-208-470-1